ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වමහ.

---

**No. 5,232, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 21වෙනි දිනවූ අඟහරුවාද පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී බදුදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ අටකලන්කෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 12. ගම—වෙල්ලන්දුර.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 28E1 | පන්දෙනියහේන .. | ආණ්ඩුව, වෙල්ලන්දුර තේ සහ රබර්වතු සමිතියේ වගාව | තේ, (මී කුඹුරට අත්හැර තිබේ) | .. 0 0 12 |
| 28E2 | එම .. | එම .. .. | එම | .. 0 1 2 |

අවුරුද්දක බදුමුදල ශත 50ක් වේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වෂී 1919ක්වූ අගෝස්තු මස 23වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වමහ.

---

**No. 5,233, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර්මස 20වෙනි දිනවූ සඳුදා දවල් 12ට පොල්ගහවෙල තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ උඩපොලඹතොටකෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 4,162. ගම—බන්දුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| D 59 | කහවත්තඇලවත්ත .. | ඇම්. ඇන්. ස්වච්ටර් පාදිලිඋන්නාන්සේ | .. වත්ත | .. 3 0 6 |
| F 59 | කෝන්කුඹුරහේන .. | එම .. | .. හේන | .. 0 3 7 |
| G 59 | එම .. | එම .. | .. එම | .. 0 1 13 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| z 58 | කහවත්තඇලවත්ත | පුංචිසිංඤෝ | වත්ත | 2 1 12 |
| c 59 | කනුකැටියවත්ත | කෝනාරමුදියන්සෙලාගේ බන්ඩා | එම | 1 3 0 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වරයා.

---

**No. 5,234, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට අලව්වේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ නැගෙණහිර උඩුකහකෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 416. ගම—උඩුමුල්ල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 34A | මූකලානගාවහේන | (1) රත්නායකමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එම උක්කු රාල හිටපු ආරච්චි, (3) එම් බාලහාමි | හේන | 2 3 24 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 වනතුරුය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වරයා.

---

**No. 5,235, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දිනවූ සඳුදා දවල් 12ට පොල්ගහවෙල තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ උඩපොල ඔතොටකෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් නොම්මර 4රේ ලංකාමැනීමේ සිතියම 632. ගම—ගල්බොඩගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුරුඳුගස්පැල | ආණ්ඩුව ; රත්හොවිපේඩිගේ තෙන්නාගේ වගාව | වි | 0 0 5 |
| 2 | ගලන්දේවත්ත | ආණ්ඩුව ; රන්හොවිපේඩිදුරයාලාගේ වික්කාගේ වගාව | වත්ත | 1 1 6 |
| 3 | පිටකොටුවවත්ත | ආණ්ඩුව ; ලේකම්ගේ කපුරුහාමිගේ වගාව | එම | 0 1 7 |
| 4 | ලිඅඹගහමුලවත්ත | ආණ්ඩුව ; ජයසිංහආරච්චිලගේ රන්හාමිගේ වගාව | එම | 0 0 10 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 50ෙත් සිට රුපියල් 100ක් වේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වරයා.

---

**No. 5,236, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 12ට පුස්සකොලදෙනියේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 558. ගම—ඊලිගල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 21B | කොලොන්ගහමුලිහේන | ආණ්ඩුව ; කේ. පී. සිඤ්ඤප්පුගේ වගාව | හේන | 2 0 1 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 40ක් වේ.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වරයා.

---

**No. 5,237, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 12ට පුස්සකොලදෙනියේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 558. ගම—ඊලිගල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 21AF | මිනිමරුගොඩැල්ලේමූකලාන | ආණ්ඩුව | කැලය | 10 3 13 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 50 සිට රුපියල් 150 වනතුරුය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වරයා.

**No. 5,238, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට අලව්වේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යොදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනි හත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ කොඩසගේ පිහිටාතිබෙන බිම්කැබෙලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 472. ගම—සියඹලාපිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | යකදරමූකලාන | ආණ්ඩුව | මූකලාන | 1 3 7 |
| 4B | එම | එම | එම | 3 0 37 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 75 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුකරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වෂී 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරීස් වෂීහ.

---

**No. 5,239, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට අලව්වේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යොදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ කොඩසගේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 479. ගම—අඹිබොව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 59A | අඹිබොවේවැව | ආණ්ඩුව, කරුනානායක්කිලියාගේ හුරකලා දුරයාගේ සහ කිරියාගේ වගාව | වී | 0 1 7 |
| 59B | එම | ආණ්ඩුව, අඹිබොව විහාරය භාරකාරයින්ගේ වගාව | එම | 0 1 11 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 50සේ සිට රුපියල් 100 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරීස් වෂීහ.

---

**No. 5,240, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දිනවූ බෘහස්පතින්ද දවල් 12ට පුස්සොල්ලදෙනියේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යොදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ කොඩසගේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 559. ගම—අතුරුවල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 8½M | ඉළුකේහේන | අබේසිංහමුදියන්සෙලාගේ සියාතු බන්ඩා සහ මල්වාඅච්චිලාගේ උක්කුබන්ඩා | කැලය | 2 0 38 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, එහේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වෂී 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරීස් වෂීහ.

---

**No. 5,241, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දිනවූ බෘහස්පතින්ද දවල් 12ට පුස්සොල්ලදෙනියේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යොදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ කොඩසගේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 559.—අතුරුවල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 16I | මොරගොල්ලේමූකලාන | ආණ්ඩුව | මූකලාන | 1 1 25 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 200ක් වේ.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, එහේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරීස් වෂීහ

---

**No. 5,242, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට අලව්වේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යොදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනි හත්පත්තුවේ නැගෙණහිර උඩුකහකෝරලේ කොඩසගේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 457. ගම—නුගවෙල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 16B | බෙලිගහමුලහේන | මැනික්පුරයාලාගේ සාමෙලා | හේන | 1 0 37 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 16F | මහඅඹගහමූලහේන.. | (1) සිත්තරආචාරි ගනිතයාලාගේ උන්ගා, (2) මැනික්දුර යාලාගේ කිරා, (3) හෙන්දා, (4) ඩිංගිරියා .. | වත්ත සහ හේන | .. 1 3 28 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට. එනම්:—මිද්දෙනියේ වැවේ සහ එහි ඇලේ ප්‍රවේසම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 396. ගම—මිද්දෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ රූ. ප. |
|---|---|---|---|---|
| 33D | පන්සලගාවකොරටුව | හේන .. | ගෞ. බෙන්ගමුවෙ බුඩරක්කිත, පැලිගේ දෙන් නිකුලස් සහ දෙන් දාවිත් අබේසිංහ බාරකාරතැන, මිද්දෙනිය | .. 0 1 18 |
| 33A1 | එම | .. ඕවිට .. | එම .. | .. 0 0 9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 22වෙනි දින දවල් 1ෙක් කනිසමට හම්බන්තොට කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 22වෙනි දින
හම්බන්තොට කචේච්රියේදීය.

ඩබ්ලිව්. ඇල්. මේපි,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කොළඹ දැන්වීම නො. 7,347.]

**වර්ෂ 1897තේ, 1899යේ 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 29වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම්වලට නොහොත් එයින් එකකට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම තමන් විසින් හෝ ලියවිල්ලකින් කියා නොසිටියොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබීතිබෙන බලපූර්වන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තකඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ජී ඇස්. වුඩ්මන්,
කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

කියන්නේ මේ ඉඩම ගැණයි.

මීට යාකරණලද සිතියමේ* පෙණෙන බස්නාහිර දිසාවේ මීගමු දිස්ත්‍රික්කේ හාපිටිගම්කෝරලේ උඩුගහපත්තුවේ මුගුරුගම්පොල හන්දුරුමුල්ල යන ගම පිහිටි මෙහි පහත සඳහම්වූ බිම්කට්ටිය:—

මූල් සිතියම 16,495.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 .. | ගලහිටියාමොට්ටාව .. .. .. | .. 4 2 17 |

මීට මායිම්—උතුරු නැගෙණහිරට නොම්මර 53,736, 269,271 සහ 53,736 දරණ පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩම් සහ පාරේ හිට ගමට යන අඩිපාරද; දකුණු නැගෙණහිරට ගිරිගෝරිස්අප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියා සිටින ගලගාවා වත්ත සහ උතුරු බස්නාහිරට නොම්මර 258,210 සහ 257,065 දරණ පිඹුරුකඩදාසිවල පෙණෙන ඉඩමුත්ය.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1306වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[කළුතර දැන්වීම, නො. 7,348.]

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 29වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුඉඩම් සම්බන්ධව වර්ෂ 1897තේ 1899යේ 1900යේ සහ 1903යේ ආඥාපණත්වල ප්‍රකාරයට, පත්කරනුලැබූ කළුතර කච්චේරියේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී උප ඒජන්ත උන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ටී. ඒ. හොට්සන්,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වම්හ.

### ඉඩම්වල තොරතුරු.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ නැගෙණහිර පස්දුන්කෝරළේ දකුණු මහපත්තුවේ කළුගල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මුල් සිතියම 16,410.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 | .. | උඩුවකන්දේහේන | .. | .. | .. .. | 1 3 0 |
| 2 | .. | එම | .. | .. | .. .. | 1 0 10 |
| 3 | .. | උඩුවකන්දේහේන නොහොත් නාරන්ගහකැලේ | | | .. .. | 1 3 9 |
| | | | | | | 4 2 19 |

මීට මායිම්—උතුරට ජී. බස්තියන් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩුවකන්දේකුඹුරද; නැගෙණහිරට ජී. බස්තියන් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩුවකන්දේකුඹුරද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන නාරන්ගලකැලේද; දකුණට සහ බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන නාරන්ගලකැලේද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1306වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

### ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

කොළඹ කුරුඳුවත්තේ තිබෙන මෙහි පහත පෙනෙන ලැයිස්තුවේ සම්පූර්ණයෙන් සඳහන්කර තිබෙන ඉඩම් කට්ටිය බදු ඔප්පුවට අඩංගුවන පොරොන්දුවලට යටත්ව (මෙම පොරොන්දු කොළඹ කච්චේරියෙන් දැනගත හැකිවේ) වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 1වෙනි දින පටන් අවුරුදු 5ක බද්දට විකිණීමට මුද්‍ර තබාපු ඉල්ලුම්පත්‍ර නොහොත් ටැන්ඩර් පත්‍ර බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගන්නා බව මෙසින් දන්වමි.

2. ටැන්ඩර්පත්‍ර "කොළඹ කුරුඳුවත්තේ බදු ඉල්ලීමේ ටැන්ඩර්පත්‍රයයි" කියා ලියුම් කවරයේ පිට ලියා දමන්ට ඕනෑය. මේ පත්‍ර කොළඹ කච්චේරියේදී වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 30වෙනි සෙනසුරාද දවල් 12 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ටැන්ඩර්පත්‍රය සැබෑබව ඔප්පුවීමට ටැන්ඩර් ඉල්ලුම්කරන්නාවූ සියල්ලම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන් නෙක් පෙනීසිටින්ට ඕනෑය. ඒජන්ත උන්නාන්සේවැඩිම නොහොත් කොයියම් ඉල්ලුම්පත්‍රයක්වත් බාරගන්ට බැඳීනැත.

3. ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකිරීමට ඒජන්ත උන්නාන්සේ විසින් තෝරාගන්ට යෙදෙන ටැන්ඩර් පත්‍රයේ ඉල්ලුම්කාරයා විසින් අවුරුද්දක බදු මුදලෙන් දහයෙන් කොටසක් මුදලෙන් කච්චේරියේ තැන්පත්කරන්ට ඕනෑබවත්, උතුමාණන්වහන්සේ විසින් ටැන්ඩර්පත්‍රය ස්ථිර කරන්ට යෙදුනොත් ඔහුගේ ඉල්ලීම පිළිගත් බවට දැන්වී ලැබී 14 දවසක් ඇතුළතදී මුළු බදු මුදලෙන් පහෙන් පංගුවකට ඉඩම්වලින් ඇප තිබන්ට හෝ මුළු බදු මුදලෙන් 10යෙන් කොටසක් කාසිවලින් හෝ ඇප බඳින්ට ඕනෑය.

4. ඇප තබන්ට යෙදෙන ඉඩම්වල මුල් ඔප්පු විභාගකිරීමට ගෙවියයුතු ආණ්ඩුවේ අද්වකාද් උන්නාන්සේගේ ගාස්තුද, ඉඩම්වල තක්සේරු ගාස්තුද, ඇප ඔප්පු රිජිස්තර්කිරීමේ ගාස්තුද වෙනුවට මුදල කච්චේරියේ බදු ගැනුම්කාරයා විසින් තැන්පත්කරන්ට ඕනෑය.

5. ඇප බඳින්ට යෙදෙන සියලුම ඔප්පුවල ඉඩම් ලියාපදිංචිකරන රිජිස්ත්‍රාර් විසින් ඒ ඉඩම් වෙන නය ඇප උකස් ආදියකට යටත් නැති බවට සහතිකපත්‍රයක් තිබෙන්ට ඕනෑය. මේ සහතිකපත්‍රය ඔප්පු බාරදෙන අයගේ වියදමින් ලබාගන්ට ඕනෑය.

6. තවත් වැඩිදුර කාරණ කොළඹ කච්චේරියෙන් ඉල්ළුම් කළවිට ලබාගත හැකිවේ.

ජේ. ජී. ෆ්‍රේසර්,
ඒජන්ත උන්නාන්සේ වෙනුව.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 21වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

කුරුඳුවත්තේ බදු සිතියමේ සඳහන්ව තිබෙන බිම්කට්ටිය.

| නො. | පිහිටීම. | | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 22A | වැලිකඩ | කුරුඳු සහ තණකොළ | .. | 48 1 12·75* |

* මෙසින් අක්කර 22ක් මඩවගුරය.

---

වර්ෂ 1920ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසානවන අවුරුද්දට මෙහි පහත සඳහන්වෙන බස්නාහිර පලාතේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන ටැන්ඩර්ස් හෙවත් ඉල්ළුම්පත්‍ර වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 15වෙනි සඳුදින දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් බාරගනු ලැබේ.

මෙහි පහත සඳහන්වෙන එක එක රේන්දයට වෙන වෙනම ටැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාමමෙහි තබන්නට ඕනෑය. එම ඉල්ලීම කෝමිටියේ ප්‍රධානතැන විසින් භාරගන්ට යෙදුනේනම්, ඔහුගේ ඉල්ලීම ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට නට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා කොමිටියේ පෙරකදෝරුතැනට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණ කිරීමටද, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර් කෙරීමටද, වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත (අළුත් වැඩියාකරණලද 1917 නො. 16 පනත) අන්දමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගතයුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇපතබන අය විසින් දැරියයුතුයි.

යම් ටැන්ඩරයක් හෝ ටැන්ඩර් සියල්ලම ප්‍රශනයක් නැතිව ප්‍රතික්ෂෙපකිරීමේ බලය කොමිටියේ ප්‍රධානතැනවෙත තබාගන්ට යෙදුනා ඇත.

මේ ගැන වැඩිදුර කාරණ පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ළුම්කලවිට දැනගන්ට පුළුවන.

ප්‍රධාන පාරවල්වල තොටුපල් රේන්ද.
ගාල්ලට යන පාරේ.

හේනේමුල්ල, ගොරකපල සහ දිගල තොටුපල් රේන්ද.
ප්‍රධාන පාරවල් නොවන පාලම් රේන්ද.

A.—කොළඹ දිස්ත්‍රික්කුවේ
1. හංවැල්ලේ තොටුපල් රේන්දය.
2. පූගොඩ ,,
3. වෑවල ,,

B.—මීගමු දිස්ත්‍රික්කුවේ.
1. සීදූවේ තොටුපල්රේන්දය.
2. මුතුවාඩියේ තොටුපල්රේන්දය.

C.—කළුතර දිස්ත්‍රික්තුවේ.
1. රුක්ගහතොටුපල තොටුපල්රේන්දය.
2. කිතුල්ගහවත්ත ,,
3. අඟුරුවාතොට ,,
4. කලවැල්ලෑවේ ,,
5. බදුරලියේ ,,
6. වෙරළුගස්තොටුපල (නොහොත්) fප්‍රොසැස්ටර් fපැරි තොටුපල් රේන්දය.

හේනේමුල්ලේ තොටුපල් රේන්දය ගන්නාවූ අය මිනිසුන් පමනක් එගොඩ මෙගොඩ කරන්ට ඕනෑ බවත් ඒ පිණිස පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන පිළිගත් ඔරුවක් තමන්ගේ වියදමෙන් තබන්ට ඕනෑ බවත් දැනුම්දෙනු ලැබේ.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 25වෙනි දින
පලාතේ රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1920ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන්වෙන පාලම් රේන්ද මිලේට ගැණීම පිණිස දෙන ටැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින දවල් 12ට බදුල්ලේ කච්චේරියේදී ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගන්ට යෙදෙන බව මෙයින් දැනුම් දුන්නා ඇත.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් සල්ලිවලින් වහාම බදින්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනේ නම් ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ සම්පූර්ණ මුදලෙන් දෙකෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කිරීමට ගෙවියයුතුවූ ගාස්තුත් ඔහු විසින්ම ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත් නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්තාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම් ඇපතබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැණ වැඩිදුර කාරනා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

පාරුරේන්දය.—හෙඹරස්තොට.

ඒ. ඊ. ක්‍රිස්ටෝපල්ස්,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 22වෙනි
දින බදුල්ලේ කච්චේරියේදීය.

---

පුත්තලමේ දකුණු ලුණු ඩිපෝඑකේ නොම්මර 32, 34 දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීමට ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍ර සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප්එකේ පිට පැත්තේ වම් කොනේ මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්:—පුත්තලමේ දකුණු ලුණු ඩිපෝඑකේ නොම්මර 32 සහ 34ත් දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීමට ඉල්ලුම්පත්‍ර යයි." තවද එකී ඉල්ලුම්පත්‍ර වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 8වෙනි දින පස්වරු 1ට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලුම්කරන්ට අදහස්කරණ තැනැත්තා ඔහුගේ ඉල්ලුම්පත්‍රය ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේට එවන්ට මත්තෙන් "ටැන්ඩර් ෆෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් කොයිම කච්චේරියක හරි බදින්ට ඕනෑය. එසේ සල්ලි බැඳ ලබාගත් රිසිට් එක ඉල්ලුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. මෙසේ බදිනලද රුපියල් 10ය ඉල්ලුම්කාරයා, ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ සමග, ඔහුගේ ඉල්ලුම්පත්‍රය බාරගත් කල්හි කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. එනම් බාරගන්න වැඩේ සතුටුදායක අන්දමකට කරදෙනවාය කියා පොරොන්දුවක් වශයෙන්ය. එසේ සෑහෙන කාලයක් ඇතුළතදී එම කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට නොයෙදුනොත්, එසේ බදිනලද මුදල රජසන්තක කරනු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලියුම් ලැබෙන පිණිස නොහොත් බාරදීම පිණිස ඇඩ්‍රැස්එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට ඇතුල්වී සුමාන 4ක් ඇතුළතදී බාරගත් වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණ පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර් මහතාගෙන් දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

ගොඩනැගිල්ලේ දැනට තිබෙන්නාවූ සියලුම දිරාගිය නොහොත් වෙන යම් විදියකට නොවටිනා පොල්අතු ලීදඬු යනාදිය අහක්කොට ඒවා වෙනුවට අලුත් සවිඇති ඒවා දමන්ට ඕනෑය.

ස්ටෝරුවල වහලවල්වලට අලුත් පොල්අතු බදින්ට ඕනෑය. එම වහලවල් උඩ බර වෙනුවට මාංගු දමන්ට ඕනෑය.

ගෙයි බිම් මැටිදමා උස්කර තදකර සමතලාකරන්ට ඕනෑය.

පොල්අතු බිත්තිවල තිබෙන පරණ පොල්අතු අහක්කොට ඒ වෙනුවට අළුත් ඒවා දමන්ට ඕනෑය. තවද එම බිත්තිවල එබීගොස් තිබෙනතැන් කෙලින්කරන්ට ඕනෑය. ස්ටෝරුවල ඇතුල්පැත්තට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය.

ඈස්. ඈම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 25වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

සුප්‍රීම්උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් ගාළු දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ජේ. ඒ. ලොරැන්ස්,
පිස්කල් වම්හ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 20වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් දකුණු දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ජේ. ඒ. ලොරැන්ස්,
පිස්කල් වම්හ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 20වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

---

අන්‍ය දැන්වීම.

වර්ෂ 1920 සහ 1921 යන අවුරුදුවලට මීගමුවේ නගරවර්ධන සහ සනීපාරක්ෂක ප්‍රදේශ සමිතියට තිල නොලත් සමාජිකවරුන් තිදෙනෙක් තෝරාගැනීම පිණිස එම සභාවේ ලිපිශාලාවේදී වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 11වෙනි දින පෙරවරු 9ට රැස්වීමක් පවත්වනුලබන බවත් සමාජිකකම්වලට ඉල්ලුම් කරන්නන්ගේ නාම යෝජනාවල් 1919ගේ දෙසැම්බර් මස 3වෙනි දිනට මත්තෙන් මිස ඊටපසුව භාරනොගන්නා බවත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 20වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ඒජන්තතැන වම්හ.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.